## දරුවන් උදෙසා බයිබලයක්

# ජේසුස් වහන්සේ සිදුකළ හාස්කම්



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus
Alastair Paterson

සකස්කරන්නා: E. Frischbutter; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ජේසුස් වහන්සේ බොහෝ හාස්කම් සිදුකළ සේක. ඒවා උන්වහන්සේ සැබවින්ම දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව පෙන්වන ලකුණු විය. පළමු හාස්කම සිදු වූයේ විවාහ මංගල්‍යයකදීය. ප්‍රශ්නයක් මතුවිය. පැමිණ සිටි සියල්ලන්ටම ප්‍රමාණවත් ලෙස මිදියුස නොතිබුණි.



ජේසුස් වහන්සේගේ මව, මරියා එතුමන්ට ප්‍රශ්නය පැවසුවාය. ඉන්පසු ඇය ජේසුස් වහන්සේ අණ කරන ලෙසටම කරන්නට සේවකයන්ට කීවාය.



“මේ භාජන වලට වතුර පුරවන්නයැ” යි ජේසුස් වහන්සේ කී සේක. “වතුර?” ඔවුන් සමහරවිට අසන්නට ඇති. ඔව්, ජේසුස් වහන්සේ පැවසුවේ වතුර පුරවන්නටය.



ඉන්පසු ජේසුස් වහන්සේ ඒවා විශාල භාජනයෙන් ගෙන, මංගල්‍ය ප්‍රධානියාට රස බලන පිණිස ගොස් දෙන ලෙස සේවකයාට කී සේක. වතුර, මිදියුස වලට හැරී තිබුණි. ඒවා ඉතාම ඉහළ මිදියුස විය!



සේවකයෝ පුදුම වූවෝය.
ජේසුස් වහන්සේ විසින් වතුර,
මිදියුස බවට හරවා තිබුණි.
එවැනි හාස්කම් කළ හැක්කේ
දෙවියන් වහන්සේට පමණි.



ජේසුස් වහන්සේ තවත් හාස්කම් සිදුකළ
සේක. එක් සන්ධ්‍යාවක උන්වහන්සේ
සහ ගෝලයෝ පේදුරුගේ නිවසට
ගියෝය. පේදුරුගේ බිරිඳගේ මව උණ
රෝගය වැළඳී බොහෝ සේ අසනීපව
සිටියාය.



ජේසුස් වහන්සේ අසනීපව සිටි තැනැත්තියගේ අත ඇල්වූ සේක. මොහොතකින් ඇය සුව වූවාය. ඇය නැඟිට ජේසුස් වහන්සේටත් ගෝලයින්ටත් සංග්‍රහ කළාය.



ඒ සන්ධ්‍යාවේ මුළු නුවරම වැසියෝ ඒ නිවසේ දොර අසළට රැස් වූවෝය. අසනීප වූවෝ පැමිණියෝය. ඔවුහු ඇස් නොපෙනෙන, කන් නොඇසෙන, කතා කළ නොහැකි සහ කොරවූ අය වූවෝය. යක්ෂයින් වැහුණු මිනිස්සුද බොහෝ පිරිසක් ජේසුස් වහන්සේ වෙත පොරකමින් පැමිණියෝය. උන්වහන්සේට එතරම් විශාල ප්‍රමාණයකට පිහිට විය හැකි වේවිද?



ජේසුස් වහන්සේට, දෙවියන් වහන්සේගේ පුත්‍රයාට එය කළ හැකිය. ජේසුස් වහන්සේ ඔවුන්ට පිහිට වූ සේක. උන්වහන්සේ වෙත ආ සියලු දෙනා සුව වූවෝය. මුළු ජීවිත කාලයම කිහිලි කරු වලින් ඇවිදින්න සිදුවූ මිනිසුන්ට දැන් ඒවා නැතිව ඇවිදින්ටත්, දුවන්ටත් පනින්ටත් හැකි විය.



තවත් අය පැමිණියෝය.
ඔවුහු ලාදුරු රෝගය
වැළඳී විරූපීව සිටියෝය.



ජේසුස් වහන්සේ
ඔවුන් සුව කළ විට
ඔවුහු සම්පූර්ණයෙන්
පවිත්‍ර වූහ.



යක්ෂයන් වැහුණු පිරිමි සහ ගැහැණු ජේසුස් වහන්සේ ඉදිරියේ සිටගත්තෝය. උන්වහන්සේ යක්ෂයින්ට ඔවුන් අතහැර පිටවෙන්න අණ කළ සේක. යක්ෂයින් ජේසුස් වහන්සේගේ අණට කීකරු වූ විට බියෙන් සහ දුකින් සිටි මිනිස්සු සන්සුන් වී ප්‍රීති වූවෝය.



මිනිසුන් අතර සිටි හතර දෙනෙක් ඔවුන්ගේ මිතුරා ජේසුස් වහන්සේ වෙත ගෙනෙන්න උත්සහ කළෝය. නමුත් ඔවුන්ට උන්වහන්සේට ළංවන්න නොහැකි විය. ඔවුන්ට කුමක් කළ හැකි වේවිද?



අසනීපව සිටි මිනිසා ඔසවාගෙන
නිවසේ වහල මතට නැඟී ඇදහිලිවන්ත
මිතුරන් හතර දෙනා වහල ගලවා
ඔහුව එතැනින් පහත් කළේය.
දැන් ඔහු ජේසුස් වහන්සේට
සමීපව සිටින්නේය.



ජේසුස් වහන්සේ,
මිතුරන් හතර
දෙනා සතුවූ
විශ්වාසය දුටුසේක.
උන්වහන්සේ
අසනීපව සිටි
මිනිසා අමතා,
“ඔබගේ පව් වලට
සමාව ලැබේ. ඔබේ
ඇඳ රැගෙන ඇවිද
යන්නයැ” යි කී
සේක. ඒ මිනිසා
ශක්තිමත් වී නැඟිට
සිටියේය. ජේසුස්
වහන්සේ ඔහු සුව
කළ සේක.



ඉන් ස්වල්ප වේලාවකට පසු ජේසුස් වහන්සේ තම ගෝලයින් සමඟ ඔරුවක නැඟී ගිය සේක. බිය ගෙනදෙන කුණාටුවක් ඇතිවී මුහුද කැළඹවීය. ජේසුස් වහන්සේ නිදාසිටි සේක. බොහෝ සේ බියවී සිටි ගෝලයෝ උන්වහන්සේ ඇහැරවූවෝය. “ස්වාමිනි අප බේරා ගත මැනව. අප විනාශ වෙනවායැ” යි ඔවුහු කෑගැසුවෝය.



"නිශ්චල වන්න"යැයි ජේසුස් වහන්සේ මුහුදු රළට අණ කළසේක. වහාම මුහුද නිශ්චල විය. "මෙතුමා මොන ආකාරයේ මනුෂ්‍යයෙක් දැ"යි උන්වහන්සේගේ ගෝලයෝ රහසින් කතා කළෝය. සුළඟ සහ මුහුද පවා උන්වහන්සේට කීකරු වන්නේය. උන්වහන්සේ කළ හාස්කම් වලින් දෙවියන් වහන්සේගේ මහිමය ප්‍රකාශ වුන නිසා ඔවුහු උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව විශ්වාස කළෝය. නමුත් ජේසුස් වහන්සේ මිනිසුන් අතර දෙවියන් වහන්සේ හට සේවය කළ නිසා, ඊටත් වඩා විශාල හාස්කම් ජේසුස් වහන්සේ සිදුකරනු ඔවුන් දකින්නට යන බව ගෝලයෝ නොදැන සිටියෝය.



ජේසුස් වහන්සේ සිදුකළ හාස්කම්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. මතෙව් 8-9, ශු. මාර්ක් 1-2, ශු. මාර්ක් 4,
ශු. ලූක් 4, ශු. ලූක් 8, ශු. ජොහාන් 2

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)